**නෙළුව ප්‍රාදේශීය සභාව - 2023**

**--------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නෙළුව ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක් වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට නෙළුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

  පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්‍ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6 (ඇ) ඡේදය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට පැවති මෝටර් රථ හා කරත්ත වටිනාකම රු.323,790 ක් හා උසාවි දඩ බිල් කිරීම් රු.107,128 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | පොදු මුදල් පොතේ ශේෂය හා බැංකු ජංගම ගිණුමේ ශේෂය අතර රු.21,899 ක වෙනසක් පැවතුණි. | -එම- | -එම- |
| (ඇ) | භාවිතයට නොගන්නා වටිනාකම රු.27,220 ක් වූ විදුලි තොගය පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට ගිණුම් ගතකර නොතිබුණි. | -එම- | -එම- |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.11,650,093 ක් වූ ගිණුම් විෂයයන් 14 ක් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | එකඟ වන බව. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | | | |
| | (i) 23 වගන්තිය | මාර්ග පිළිබඳ විස්තර ඇතුළත් මාර්ග ඉන්වෙන්ට්‍රි ලේඛනයක් නඩත්තු කළයුතු වුවත්, එම ලේඛන සකස් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කර ගන්නා බව | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| | (ii) 24 වගන්තිය | 2020 වර්ෂයෙන් පසු සභා බල ප්‍රදේශයේ පවතින සභා පාරවල් පිළිබඳ විස්තර ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත්කර නොතිබුණි. | -එම- | -එම- |
| | (iii) 134(1) වගන්තිය | සභා බල ප්‍රදේශය තුළ පවතින දියුණු ප්‍රදේශ හඳුනාගෙන එහි වූ නිශ්චල දේපල සඳහා වරිපනම් බදු අයකර ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | දියුණු කළ ප්‍රදේශයක් ලෙස නම් කර ඇති බව | -එම- |
| (ආ) | 2021 පළාත් සභා (මූල්‍ය හා පරිපාලන ) රීති 560 හා 561 | පරිගණක හා ඒ ආශ්‍රිත උපාංග හා මෘදුකාංග වෙන් වෙන්ව ලේඛන ගත කළයුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කර ගන්නා බව | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104 | කැබ් රථයට සිදුව තිබූ හානි සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | -එම- | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාවේ නිලධාරීන් 07 දෙනෙකු වර්ෂ 05 ක සිට වර්ෂ 10 ක් අතර කාල පරාසයක් තුල චක්‍රලේඛ නියමයන්ට පටහැනිව එකම ස්ථානයේ සේවයේ නිරත වන බව දක්නට ලැබුණි. | වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර යොමු කර ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ 2018 මැයි 22 දිනැති අංක SS/02/12/05 දරන චක්‍රලේඛය | භාවිතයට ගත නොහැකි පරිදි දිරාපත්ව අබලන් තත්ත්වයේ පැවති වාහන හා යන්ත්‍රෝපකරණ 04 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | ට්‍රැක්ටර් බවුසරයේ දිරාපත් වූ ස්ථාන සකස් කර භාවිතා කිරීමට කටයුතු කරන බව හා දිරාපත්වී ඇති අනෙකුත් වාහන අපහරණය කිරීමට කටයුතු කරන බව | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,615,264 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,178,452 ක් විය.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| බදු | 354,040 | 444,710 | 436,742 | 114,172 | 425,000 | 438,883 | 390,772 | 106,204 |
| කුලී | 6,878,922 | 10,530,990 | 6,607,203 | 7,242,474 | 7,587,694 | 6,561,510 | 6,843,559 | 3,318,687 |
| බලපත්‍ර ගාස්තු | 201,500 | 245,250 | 245,000 | 250 | 283,600 | 172,430 | 172,430 | - |
| වෙනත් ආදායම් | 2,283,500 | 4,051,459 | 3,153,337 | 1,014,298 | 2,395,604 | 1,076,653 | 1,102,737 | 116,176 |
| | 9,717,962 | 15,272,409 | 10,442,282 | 8,371,194 | 10,691,898 | 8,249,476 | 8,509,498 | 3,541,067 |

#### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ මුළු ආදායම රු.3,541,067 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු.15,272,409 ක් විය. වර්ෂය අවසානයට හිඟ ශේෂය රු. 8,371,194ක් විය. | ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කඩ කාමර සඳහා වූ සෑම ගිවිසුමක්ම වසර 03 කට වරක් යාවත්කාලීන කළයුතු වුවත්, සභාව සතු කඩ කාමර 08 කට අදාළ බදු ගිවිසුම් 2020 වර්ෂයේ සිට ඉදිරි වසර 04 කට වලංගු වන සේ ගිවිසුම්ගත වී තිබුණි. තවද කඩ කාමර 13 කට අදාළ බදු ගිවිසුම් 2019 වර්ෂයෙන් පසු යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අදාල කටයුතු ඉදිරියේදි සිදු කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | නෙළුව සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර කුලියට ලබා දීම මත වසර 01 ත් වසර 03 ත් අතර කාලයක සිට කඩ හිමියන් 12 දෙනෙකුගෙන් රු.474,096 ක් සහ වසර 03 ට වැඩි එක් කඩ හිමියෙකුගෙන් රු.48,715 ක් අයවීමට තිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව | හිඟ ආදායම් අයකර ගත යුතුය. |
| (ඈ) | වසර 01 ත් 03 ත් අතර කාලයක සිට මාළු අලෙවි සැල කුලියට ලබා දීම මත රු.175,165 ක මුදලක් ද, දූවිලි ඇල්ල වාර්ෂිකව ටෙන්ඩර් මත අයවිය යුතු කුලී මුදල සඳහා පුද්ගලයින් දෙදෙනෙකුගෙන් රු.615,809 ක් ද අයවීමට තිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව | හිඟ ආදායම් අයකර ගත යුතුය. |
| (ඉ) | ලේඛනය අනුව සභා සීමාව තුළ ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු 70 ක් වෙනුවෙන් 2022 දෙසැම්බර් 30 දිනැති අංක 2313 ගැසට් පත්‍රයේ විධිවිධාන ප්‍රකාරව රු.449,025 ක ගාස්තුවක් අයකර ගෙන නොතිබුණු අතර, මේ සම්බන්ධව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් උසාවි දඩ රු.815,153 ක් හා මුද්දර ගාස්තු රු.5,683,520 ක් ලැබිය යුතුව තිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දූලි ඇල්ල කඩ කාමර ඉදිකිරීම (දෙවන අදියර) අත්වැට සකස් කිරීමේ කර්මාන්තය සඳහා 2021 දෙසැම්බර් 15 දින ප්‍රධාන ලේකම්ගේ වැය ශීර්ෂය මත ප්‍රතිපාදන ලැබී තිබුණ ද, ප්‍රතිපාදන ලැබී වසරක් ගතවන තෙක් මෙම කර්මාන්තය සිදු නොකිරීම නිසා භාණ්ඩ මිල වැඩිවීම හේතුවෙන් රු.199,753 ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි. | අමුද්‍රව්‍ය මිල සිඟ්‍ර ලෙස ඉහල යාම හේතුවෙන් කොන්ත්‍රාත්කරුවකු ඉදිරිපත් නොවුනු බව. | අනුමත සංවර්ධන යෝජනා කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පරිසර බලපත්‍ර ලබා ගතයුතු ආයතන 23 ක් බලපත්‍ර ලබා නොගැනීම නිසා එමගින් පරිසරයට වන හානිය පිළිබඳ සභාවේ අවධානය යොමු වී නොතිබූ අතර, ඒ අනුව බලපත්‍ර ගාස්තු වශයෙන් රු.103,500 ක් හා පරීක්ෂණ ගාස්තු වශයෙන් රු.69,000 ක් සභාව අය කරගෙන නොතිබුණි. | අදාල කටයුතු කඩිනමින් සිදු කරන බව. | ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | අංක කරන ලද වීථි පහන් ලේඛනයක් නඩත්තු කර නොතිබූ බැවින් එක් එක් පහන් කණුවකට සිදු කරනු ලබන අළුත්වැඩියා පිළිබඳ විස්තර හඳුනා ගත නොහැකි අතර, වීථි පහන් කණු අතර දුර හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් ද සකස් කර නොතිබුණි. 2023 වර්ෂයේ දී වීථි පහන් නඩත්තුව සඳහා රු.434,009 ක වියදමක් දරා තිබුණි. | බල ප්‍රදේශයේ වීථි පහන් කණු 786ක් පමණ ස්ථාපනය කර ඇති බව. | පසු විපරම් කටයුතු සිදු කළ යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු සියළුම දේපල සභාව විසින් පරිපාලනය කළයුතු වුවද, ඊට පටහැනිව ඉඩම් 08 ක් අනවසරව භාවිතා කර තිබූ අතර, ඒ සම්බන්ධව සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (ආ) | ස්ථාවර වත්කම් ලේඛනය තුළ ඇතුළත් ඉඩම් 11 ක අයිතිය සභාව සතු නොවූ අතර, ඒවායේ අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල කටයුතු සිදු කරමින් පවතින බව. | අයිතිය නිරවුල් කර ගැනිමට කටයුතු කලයුතුය. |
| (ඇ) | 2015 වර්ෂයේ පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු වටිනාකම රු.6,800,000 ක් වූ ලීටර් 6000 ක Foton ජල බවුසරය භාවිතයට නොගෙන නිශ්කාර්යව පැවතුණි. | ඉල්ලීම් ලැබෙන නිවාස සඳහා බෑවුම් සහිත පටු මාර්ග පවතින බැවින් මෙම ජල බවුසරය ගමන් කිරීමේ අපහසුතා ඇති බව. | සභාව සතු වත්කම් භාවිතයට ගැනිම සිදු කලයුතුය. |
| (ඈ) | 2013 වර්ෂයේ දී පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු රු.60,000 ක් වටිනා ට්‍රැක්ටර් ට්‍රේලරය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනිමට කටයුතු කරන බව. | පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | පුස්තකාල පොත් සමීක්ෂණ අනුව පුස්තකාල 02 ක අස්ථාන ගත වූ පොත් 219 ක් පැවති අතර, ඒ වෙනුවෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පුස්තකාල කමිටුවේ නිර්දේශ මත සිදු කිරීමට අපේක්ෂා කරන බව. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.4 ව්‍යාපෘති, කතර්ව්‍යයන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබූ එකතු වටිනාකම රු.23,500,000 ක් වූ කර්මාන්ත 02 ක් සමාලෝචිත වර්ෂය වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | ප්‍රතිපාදන නොලැබුණ බව. | ක්‍රියාකාරි සැලැස්ම අනුව කටයුතු කළයුතුය. |
| (ආ) | දකුණු පළාත් සංවර්ධන සැලැස්ම 2023 යටතේ මාර්ග සංවර්ධනය සඳහා ව්‍යාපෘති 10 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.5,000,000 ක ප්‍රතිපාදන අනුමත වී තිබුණ ද, රු.2,900,000 ක් වටිනා කර්මාන්ත 07 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | පළාත් පාලන කොමසාරිස්ගේ 2023.12.04 දිනැති ලිපිය මඟින් ව්‍යාපෘති සඳහා වෙන් කරන ලද මුදල අවලංගු කළ බව. | නියමිත පරිදි ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සිදු කිරිම සිදු කළ යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ සේවය කර මිය ගිය නිලධාරීන් 02 දෙනෙකුගෙන් අයවිය යුතු රු.10,730 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි | පොත්වලින් ඉවත් කිරීම සඳහා සහකාර කොමසාරිස් කාර්යාලය වෙත යොමු කර ඇති බව. | ණය නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |